චක්‍රලේඛ අංක - 13/2018

මගේ අංකය : MOJ/E15/පොදු කටයුතු
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.
කොළඹ 12.
2018.09.07

සියළුම හදිසි මරණ පරීක්ෂකවරු,

<u>මාතෘ මරණ පශ්චාත් මරණ පරීක්ෂණයට යොමු කිරීම.</u>

01. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 01/ 2014 මගින් ඔබ වෙත ලබා දී තිබූ උපදෙස් පහත පරිදි සංශෝධනය කරන අතර, සියළුම මාතෘ මරණ පශ්චාත් මරණ පරීක්ෂණයට යොමු කිරීම අනිවාර්ය වේ.

02. මාතෘ මරණ සම්බන්ධව පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය ) විසින් මා වෙත යොමු කළ අංක FHB/EH/49/2016 හා 2018.05.28 දිනැති ලිපිය පරිදි පහත සඳහන් කාන්තා මරණ මාතෘ මරණ ලෙස හැඳින්වේ.

2.1. ගර්භනී කාලය තුළ සිදුවන මරණ.

2.1.1. කළලය පිළිසිඳ ගත් දින සිට ප්‍රසූතිය දක්වා මරණ.

- මෙහිදී ගැබ් කාලාන්තරය (ගර්භනී භාවයට කොතරම් කාලයක්ද යන්න ) නොසලකා ගර්භනී කාලය තුල සිදුවන සෑම මරණයක්ම මාතෘ මරණ ලෙස සැලකේ. එලෙසම කළලය පිහිටියේ ශරීරයේ කුමන ස්ථානයේ වුවද සෑම ගර්භනී මරණයක්ම මාතෘ මරණ වේ ( ඇතැම් කළලයන් ගර්භාෂයෙන් පිටත විකසනය වේ).

2.2. ගර්භනීභාවය අවසන් වීමෙන් පසු සිදුවන මරණ.

- ගර්භනීභාවය අවසන් වූ දින සිට තවත් දින 42ක් යන තුරුම සිදුවන මරණ ද මාතෘ මරණ වේ. (ගර්භනීභාවය අවසන් කිරීම - ප්‍රසූතියකින්, ගබ්සාවකින්, සැත්කමකින්, හෝ වෙනත් ක්‍රමයකින් කළලය හෝ භ්‍රෑණය පිටතට ගැනීම ගර්භනීභාවය අවසන් කිරීම ලෙස සලකනු ලබයි).

2.3. ගර්භනීභාවය හෝ ගර්භනීභාවයට අදාළ වෙනත් හේතුවක් නිසා හෝ එම ගර්භනීභාවය නිසා දැනට පවතින රෝගයක් උග්‍ර තත්ත්වයකට පත් වීමෙන් හෝ සිදුවන මාතෘ මරණ. උදා: හෘද රෝග, ඩෙංගු රක්තපාත උණ, නිව්මෝනියාව

2.4. ප්‍රමාද මාතෘ මරණ: ඇතැම් ගර්භනී මව්වරු ගර්භනීභාවයට අදාල හේතුවක් නිසා ඉහත අර්ථ දැක්වීමේ පරිදි ගර්භය අවසන් වී දින 42 ට පසුවද මරණයට පත් විය හැකිය. එවැනි ගර්භනී කාලය අවසන් වී දින 90 ක් තුළ සිදුවන මරණ ප්‍රමාද මාතෘ මරණ ලෙස සැලකේ.

03. පශ්චාත් මරණ පරීක්ෂණ <u>මාතෘ මරණ</u> සහ <u>ප්‍රමාද මාතෘ මරණ</u> යන දෙවර්ගයටම සිදු කළ යුතුය.එම නිසා ගර්භනී කාලය තුළ හෝ ගර්භය අවසන් වී දින 90 ක් තුළ සිදුවන සෑම කාන්තා මරණයක් සඳහාම පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කිරීම අත්‍යාවශය වේ.

05. ඇඳ ඉහපත් හෝ සායනික වාර්තා වල මරණයට හේතුව දක්වා තිබීම. පශ්චාත් මරණ පරීක්ෂණයක් නොකිරීමට හේතුවක් නොවේ. මාතෘ මරණයට හේතු වූ **<u>රෝගී තත්ත්වය වෛද්‍යවරු නිර්ණය කර තිබුනද</u>** , ඉහත සඳහන් කළ කාන්තා මරණ සඳහා පශ්චාත් මරණ පරීක්ෂණ අනිවාර්යෙන් සිදු කල යුතු වේ.

06. මාතෘ මරණ පශ්චාත් මරණ පරීක්ෂණයට භාජනය කිරීමේ අරමුණ මරණයට හේතුව සොයා ගැනීම පමණක් නොවන අතර එමඟින් අනාගත මාතෘ මරණ වැළැක්වීම සඳහා විශාල දායකත්වයක් ලැබෙනු ඇත. එය මෙරට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා විශාල පිටිවහලක් වන බැවින් ඉහත කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානයක් යොමු කළ යුතු බව අවධාරණය කරමි.

ඩබ්ලිව්.එම්.එම්.ආර්.අදිකාරි
ලේකම්
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත්:

01. ලේකම්, සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
02. අධ්‍යක්ෂ, පවුල් සෞඛ්‍ය කාර්යාංශය
03. ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී, අධිකරණ වෛද්‍ය නිළධාරී කාර්යාලය,කොළඹ